**දඹුල්ල ප්‍රාදේශීය සභාව - 2023**
**-----------------------------------------**

# 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

දඹුල්ල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට දඹුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ආදායම හා හිග ආදායම රු 17,240,000.ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | 2024 අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කරන බව. | ගිණුම් නිවැරදි කළ යුතුය. |
| (ආ) | 2021 වර්ෂයට අදාළව සමාලෝචිත වර්ෂයේදී හදුනාගන්නා ලද රු 1,397,000.ක ලැබිය යුතු මුද්දර ගාස්තු ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී මෝටර් ග්‍රේඩරය කුලියට දීමෙන් පෞද්ගලික ආයතනයකින් ලැබිය යුතු රු 112,500.ක් ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දි සිදුකළ ඉනාමළුව ගොඩනැගිල්ලෙහි වැසිකිළි පද්ධතිය ඉදිකිරිමේ කර්මාන්තයේ වියදම සහ ණය හිමියන් රු1.,005,844 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඉ) | වර්ෂයේ 2011 සිදු කළ සිමා නිර්ණය හේතුවෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් වාර්තාව අනුව දඹුල්ල ප්‍රාදේශීය සභාව විසින් දඹුල්ල මහා නගර සභාවට ගෙවිය යුතු මුදල රු 2,486,917.ක් ලෙස දක්වා තිබුණද රු 2,806,009.ක් මහා නගර සභාවෙන් ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු ලෙස සලකා දෝෂ සහගතව ගිණුම්ගත කර තිබුණි . | කරුණු සොයාබලා නිවැරදි කරන බව. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | සමාලෝචිත වර්ෂයේ සංචාරක හෝටල් ක 06 කාශන අනුව බිල්කළ යුතු ආදායම ප්‍රමූලා 2,570,956.රුක් වුවද එය රු 699,256.ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් බිල්කළ ආදායම හා හිඟ ආදායම රු 1.871,700.ක් අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ හෝටල් කින් ඉදිරි 02 53,684.වර්ෂය වෙනුවෙන් ලැබී තිබුණු රුක ආදායමක් සමාලෝචිත වර්ෂයේ ආදායම් සේ සලකා ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (එ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේදි මහා නගර සභාවෙන් ලබාගත් ගලිරථ සේවාව සඳහා ගෙවිය යුතු රු ක් ගිණුම්ගත 56,000 .කර නොතිබුණි | -එම- | -එම- |
| (ඒ) | සමාලෝචිත වර්ෂය තුළ බැංකුවට ලැබී තිබුණු රු 65,437.ක පොලි ආදායම ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ගිණුම් විෂයයන් 05 ක ශේෂයන් සමඟ ඊට අදාල ලේඛන හා උපලේඛන සමඟ සැසඳීමේදී රු.37,984,363 ක නොසැසඳීමක් විය. | උපලේඛන දෝෂ සහිත බවක් පවතින අතර උපලේඛන නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ නිවැරදි කල යුතුය. |

### 1.6.3 අධිකාරි බලය නොලත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ වෙනුවෙන් ලැබිය යුතු හිඟ මුද්දර 2020 හා 2017 2,356,580.ගාස්තු රුක් අයකර නොගත් පාර්ශවයන් සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමකින් තොරව ලැබීම් කාලසීමාව ඉක්මවීම් මත යැයි දක්වමින් විධිමත් අනුමැතියකින් තොරව ජර්නල් සටහන් අංක මගින් 63 කපාහැර තිබුණි | නිසි අනුමැතියකින් කපාහැරීමට කටයුතු කරන බව. | විධිමත් අනුමැතියක් ලබාගැනිමෙන් පසු හිඟ ආදායම් කපාහැරිමට කටයුතු කළ යුතුය. |

### 1.6.4 අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවිනිශ්චිත ගබඩා ගිණුමේ රු 411,946.ක හර ශේෂය සමාලෝචිත වර්ෂයේදීත් නිරවුල් කර නොතිබුණි. | ඉදිරියේදී මෙම ගිණුම නිරවුල් කිරීමට කටයුතු කරන බව | ශේෂය හදුනාගෙන නිරවුල් කළ යුතුයි. |

### 1.6.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන එකතුව රු13,793,291ක වත්කම් විෂයන් 05ක් හා රු.58,795,242ක බැරකම් ශේෂ 03කට අදාළ උපලේඛනනොකිරිම හේතුවෙන් ඉදිරිපත් , ක්ෂණය කිරීමට නොහැකි සතුටුදායක ලෙස සතොා විය. | ලිපිගොනු සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිණුම් ශේෂයන්ට අදාල ලේඛන, උපලේඛන හා ලිපිගොනු පිළියෙල කළ යුතුය.. |

### 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 104(3) හා (4) | කම්පැක්ටරයේ පැති වීදුරුව බිදී යාම හා ට්‍රැක්ටර් රථයක දකුණු පස දොර විදුරුව හා වම් පස පැති වීදුරුව බිදී යාම සම්බන්ධයෙන් ප්‍රාරම්භක පරීක්ෂණ හා පූර්ණ පරීක්ෂණයක් සිදුකර අලාභ හානි හා වගකිව යුත්තන් හඳුනාගෙන නොතිබුණි. | පරීක්ෂණ කටයුතු සිදුකරමින් පවතින බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **(ආ)** | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | | |
| (i) | 1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 දරන චක්‍රලේඛය | සභාවේ වාහන 07 ක බඳෙහි රාජ්‍ය ලාංඡනය පින්තාරුකර නොතිබුණි. | ඉදිරියේදී එම කටයුතු සිදුකරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කල යුතුය. |
| (ii) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛය | වසර 01 ත් වසර 07 ත් අතර කාලයක සිට වාහන 06 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර නොතිබුණි | ඉදිරියේදී එම කටයුතු සිදුකරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ .පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු49,949,089 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු15,101,567 ක් විය .

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i). කුලී | 22,265,000 | 5,167,977 | 4,591,342 | 2,161,139 | 29,665,000 | 3,099,407 | 2,996,617 | 1,584,503 |
| (ii). බලපත්‍ර ගාස්තු | 18,102,500 | 13,723,014 | 14,478,258 | 680,450 | 23,699,200 | 10,359,585 | 9,280,683 | 1,435,694 |
| (iii). වෙනත් ආදායම් | 34,845,248 | 114,722,678 | 138,816,474 | 33,482,920 | 42,263,576 | 27,019,469 | 22,165,669 | 11,509,800 |
| එකතුව | 75,212,748 | 133,613,669 | 157,886,074 | 36,324,509 | 95,627,776 | 40,478,461 | 34,442,969 | 14,529,997 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| )අ( | බලපත්‍ර ගාස්තු | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් දිනට 31 341,150.රුක වෙළඳ බලපත්‍ර ගාස්තු හිඟයක් පැවති අතර ඉන් රු 241,850.ක් ඉකුත් වර්ෂ වලට අදාළව විය. | සොයාබලා කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකර ගැනිමට කටයුතු කල යුතුය. |
| (ii) | පෞද්ගලික හෝටලයකින් ඉකුත් වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තුව ලෙස රු 277,512.ක් අයකර නොතිබුණි. | අදාළ මුදල අයකර ගැනීමට කටයුතු කරන බව. | ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

(ආ) වෙනත් ආදායම්

| | | | |
|---|---|---|---|
| (i) | ලේඛනගත නළ ලිං 246 ක් භාවිතයට ගැනීම පිළිබඳ භෞතික පරික්ෂාවකින් තොරව වාර්ෂිකව රු 200.බැගින් බිල්කිරීම සිදුකර තිබුණද කුලී අයකර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ ආදායම රු 870,100.ක් විය. | වාර්තාවක් සකස් කර බිල් කිරීම නතර කර කපාහැරීමට කටයුතු කරන බව. | කඩිනමින් කටයුතු කර විධිමත් අනුමැතියක් සහිතව කපාහැරීමට හෝ අයකර ගැනීමට කටයුතු කල යුතුය |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කසළ ගාස්තු හිඟ ආදායම රු 860,500.ක් වූ අතර ඉන් රු 292,500.ක ආදායමක් කසළ රැස්කිරීමේ සේවාව ලබාදීම නවතා තිබූ ආයතන කින් ඉකුත් වර්ෂ වලට ලැබිය 08 යුතු හිඟ ආදායමක්විය. | හිඟ ගාස්තු අයකර ගැනීමට කටයුතු කරන බව. | හිග ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (iii) | 2008වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා සභාව විසින් බාහිර පාර්ශව වලට රථගාල් කුලියට ලබා දිමෙන් අයවිමට ඇති ටෙන්ඩර් හිඟ ආදායම රු 1,029,121.ක් අයකර නොතිබුණි. | ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

(ඇ) උසාවි දඩ හා මුද්දර ගාස්තු

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් දිනට ලැබිය යුතු 31 .මුද්දර ගාස්තු රු8,064,300 ක් විය. | උපලේඛන ඉදිරිපත් කර ගාස්තු අයකර ගන්නා බව. | හිග මුදල් ගෙන්වා ගැනිමට කටයුතු කල යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයට අනුව 2016 461,654.රු අනාවරණය වී ඇතික භාණ්ඩ ඌණතාවය සම්බන්ධයෙන් මු(4)104.රෙ. පරීක්ෂණයක් පැවැත්වීමට කමිටු පත්කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් දින වන විටද අදාළ අලාභය අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | නව මු.රෙ. පරීක්ෂණයක් සිදුකරමින් පවතින බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | 2015 අප්‍රේල් 13 දින කැබ් රථයක් අනතුරට පත්කිරිමට අදාළව 2021 මැයි 18 දින නිකුත් කල මු.රෙ. 104(4) පරීක්ෂණ වාර්තාවේ නියෝග වලට අනුව සභාපතිවරයාගෙන් අයකරගත යුතු රු.2,367,534 ක් අය කරගැනිමට කටයුතු කර නොතිබුණි. | කොටස් වශයෙන් ගෙවීමට එකඟ වී ඇති බව. | අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විසල් දඹුල්ල ජල ව්‍යාපෘතියේ නල එළිමේදි ප්‍රාදේශිය සභා මාර්ග වලට සිදුවන හානි ප්‍රතිසංස්කරණය කිරිම සඳහා 1,000,000.දින රු 10 පෙබරවාරි 2014ක මුදලක් තැන්පත් කර තිබුණද අදාළ ප්‍රතිසංස්කරණයන් සිදු නොකර වසර ක කාලයක 09 සිට තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | ව්‍යාපෘතිය මේවන විටත් ක්‍රියාත්මකව පවතින බැවින් ඉදිරියේදී මේ පිළිබඳව සොයා බලා කටයුතු කරන බව. | මේවන විට මාර්ග වලට සිදුවී ඇති අලාභ තක්සේරු කර අයවීමට මුදලක් වේනම් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී පරිසර බලපත්‍ර ලබාගත යුතු ආයතන ගාස්තු ක බලපත්‍ර 19 අළුත්කිරීමට කටයුතු කර නොතිබීම 85,500.හේතුවෙන් රුක හිගයක් පැවතුණි. | ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව. | බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | ආයතන 172 කින් සමාලෝචිත වර්ෂයේ පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගෙන නොතිබුණු අතර ඒ හේතුවෙන් වාර්ෂිකව රු900.,.ක ආදායමක් අහිමි වී තිබුණි 000 | බලය පවරා ඇති ක්‍රියාකාරකම් සඳහා පමණක් පරිසර බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කරන බව. | බලපත්‍ර නිකුත් කර ආදායම් රැස්කිරිමට කටයුතු කල යුතුය. |
| (ඇ) | දරණ ශ්‍රී 54/ 2235 දිනැති අංක 08 ජුලි 2021 ක සමාජවාදී ජනරජයේ ජාතාන්ත්‍රිලංකා ප්‍ර දරන 41 අංක 1978 යේ පලකළගැසට් පත්‍ර 30 නාගරික සංවර්ධන අධිකාරි පනතේ අනුව අනුමැතිය ලබා දී ඇති (2) ජේදයේ අංක ක වර්ෂයක වලංගු 24 සංවර්ධන බලපත්‍ර කාලය අවසන්වී තිබුණද ඉදිකිරිම් අවසන් කර නොතිබියදී එම බලපත්‍ර වල වලංගු කාලය දීර්ඝ කිරීමට කටයුතු කර නොතිබුණි. | සංවර්ධන බලපත්‍ර දීර්ඝ කරගන්නා ලෙස හෝ අනුකූලතා සහතික ලබාගන්නා ලෙස අදාළ පාර්ශව දැනුවත් කර ඇති බව. | සංවර්ධන බලපත්‍ර දීර්ඝ කිරීමට හෝ ඉදිකිරීම් අවසන්ව ඇත්නම් අනුකූලතා සහතික නිකුත් කිරිමට කටයුතු කල යුතුය. |

## 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජකාරි වේලාවෙන් පසුව සැලසුම් කමිටු පවත්වා ඊට අදාළව දීමනා ලබාගත හැකි වුවත් රාජකාරි වේලාව තුළ සැලසුම් කමිටු පවත්වා නිලධාරින් 05 දෙනෙකුට අවස්ථා 15 කදී රු.82,500 ක දීමනා ගෙවා තිබුණි. | කමිටුවට ඉදිරිපත් වන ගොනු අදාළ නිලධාරින් මීට පෙර අධ්‍යයනය කර ඇති බැවින් රාජකාරී වේලාවෙන් පසුව කමිටුව පවත්වන බව. | ඇඟිලි සලකුණු යන්ත්‍රය මඟින් පැමිණීම පිටවීම සනාථ නොවන බැවින් අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාවේ ට්‍රැක්ටර් රථ තිබියදී ජනක මිණිපුර මාර්ගයට තාර දැම්ම සඳහා සමාලෝචිත වර්ෂයේ ජනවාරි දින පෞද්ගලික 17 ක්ටර් රථයයක් ලබාගෙන ආයතනයකින් ට්‍රැ 37,500.රුක් ගෙවා තිබුණි. | ට්‍රැක්ටර් රථ සඳහා රියදුරෙකු නොමැති වීම මත බාහිර ආයතනයකින් ට්‍රැක්ටර් පහසුකම් ලබාගත් බව. | ආයතනයේ සම්පත් පූර්ණ උපයෝජනය කල යුතු අතර අවම පිරිමැසුම් භාවයකින් කටයුතු කල යුතුය. |

## 3.5 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව පරිහරනය කරන සුසාන භූමි 72 ,69 ජාශාලා පිහිටි ඉඩමක් ප්‍ර ක්‍රීඩා පිටි ,21 කාර්යාල සංකීර්ණය පිහිටි ඉඩම හා කැබ් රථයක අයිතිය පවරා ගැනිමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනිමේ කටයුතු සිදුකරමින් පවතින බව. | වත්කම් පවරා ගැනිමට කටයුතු කල යුතුය. |

## 3.6 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**<br><br>සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති එකතුව රු 8,560,318.ක වත්කම් ඒකක ක හා 05 ක්ටර් රථයක් වටිනාකම හඳුනාගෙන නොමැති ට්‍රැ ය දක්වා කාලයක සිට නිශ්ක්‍රී 16 සිට වසර 02 වසර .හා ඌණ උපයෝජිතව පැවතුණි | වත්කම් උපයෝජනය කිරිමට කටයුතු කරන බවත් වාහන සඳහා රියදුරන් නොමැති වීම මත උපයෝජනය ගැටළුකාරී වී ඇති බව. | වත්කම් අළුත්වැඩියා කර උපයෝජනය කළ යුතු අතර අළුත්වැඩියා කළ නොහැකි වත්කම් අපහරණය කළ යුතුය. |

## 3.7 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය සැසදිමේදී තනතුරු ක පුරප්පාඩු 24 නිලධාරින් 11 සහ සෞඛ්‍ය කම්කරු තනතුරට අදාළ කම්කරුවන් දෙදෙනෙකුගේ අතිරික්තයක් විය. | ස්ථාන මාරු ලැබ පැමිණිය යුතු නිලධාරීන් නොපැමිණීම මත සේවක ඌනතා ඇති වී ඇති බව. | පුරප්පාඩු සම්පූර්ණ කරවාගත යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය, මාර්ග කම්කරු, නළ ළිං කාර්මික, පොම්ප ක්‍රියාකරු හා මුරකරු තනතුරු වල සේවය කරන සේවකයන් දෙනෙකු තම නිත්‍ය 09 තනතුරට අදාළ නොවනකාර්යාල කාර්ය සහායක, පුස්තකාල සහයක, රියදුරු හා කළමනාකරණ සේවා නිලධාරි තනතුරු වල රාජකාරි වල සේවයේ යොදවා තිබුණි. | තනතුරු වල ඇති පුරප්පාඩු හේතුවෙන් වෙනත් සේවා වල නිලධාරින් යොදාගැනීමට සිදුව ඇති බව. | තනතුරට අදාල රාජකාරි ඉටුකරවාගත යුතුය. |

**4.** **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1** **තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනතේ නියමයන්ට අනුව ප්‍රාදේශීය සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන ක්‍රියාත්මක කර නොතිබුණි. | ඉදිරියේදී ක්‍රියාමාර්ග ගන්නා බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |